*සැ. යු.* - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2022 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,278 - 2022 අප්‍රේල් මස 29 වැනි සිකුරාදා - 2022.04.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 398 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 399 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 මැයි මස 20 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 මැයි මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

397- B 082339— 353 (2022/04)
D 1 -

# පිස්කල් විකිණීම්

## සිවිල් නඩු විධාන සංග්‍රහයේ 255 වගන්තිය ප්‍රකාරව කරනු ලබන පිස්කල් විකිණීම

### පොළොන්නරුව දිසා අධිකරණයේ දී ය

කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, අංක 75,
ප්‍රධාන කාර්යාලය පිහිටි මහජන බැංකුව

නඩු අංකය : ඩීආර්/688/20
ස්වභාවය : මුදල්
ඇස්කීසි අංකය : 17/21

....................*පැමිණිලිකරු.*

*එදිරිව*

හොරතල් පේලි ගෙදර පැතුම් කුමාර අබේනායක, අංක 313,
දිඹුලාන, සිංහපුර, වැලිකන්ද

....................*විත්තිකරු.*

පොළොන්නරුව දිසා අධිකරණ නඩු අංක : ඩීආර්/688/20 දරන නඩුවේ 2020.07.24 වැනි දිනැති නියත තීන්දු ප්‍රකාශය අනුව මා වෙත නිකුත් කර ඇති දේපළ තහනමට ගෙන විකිණීමේ ඇස්කීසියේ බලය පිට පැමිණිලිකරුට අය විය යුතු රු. 1,117,429.60 ක මුදල හා එකී මුදල අයකර ගැනීමට පැමිණිලිකරුට දරන්නට වන වියදම විත්තිකරුගෙන් අයකර ගැනීම සඳහා වර්ෂ 2021.03.03 වැනි දින පොළොන්නරුව දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර් විසින් තහනමට ගන්නා ලද එකී නඩුවේ විත්තිකරුට අයත් මෙහි පහත උපලේඛනයේ සඳහන් වන චංචල දේපළ,

**වර්ෂ 2022ක් වූ මැයි මස 12 වැනි දින පෙ. ව. 11.30ට** එකී දේපළ පිහිටි අංක 313, දිඹුලාන, සිංහපුර, වැලිකන්ද යන ලිපිනයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණන බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

තහනමට ගත් දේපළ

| | |
|---|---|
| 1 | සෝපා සෙට් 01යි. ස්ටූලය සහිත |
| 2 | සැම්සුන්ග් වොෂින් මැෂින් 01යි |
| 3 | සැම්සුන්ග් AC මැෂින් 01යි |
| 4 | කොම්පසර් 01 |
| 5 | අඟල් 24 වර්ණ TV 01 |
| 6 | LG කැසට් සෙට් 01යි බෆල් සහිත |
| 7 | ලී පුටු සෙට් 01යි |
| 8 | සෝප් මහන මැෂින් 01යි |
| 9 | කෑම මේස 01 පුටු 06 සමග (ප්ලාස්ටික්) |
| 10 | ලී කැබිනට් 02 යි |
| 11 | දම්රෝ කෑම මේස 01 |
| 12 | දොර දෙක වානේ අල්මාරි 01 |
| 13 | ස්ටෑන්ඩ් ෆෑන් 01යි |
| 14 | ලී මේස 01යි |

| | |
|---|---|
| 15 | දොර දෙකේ වානේ අල්මාරි 01යි |
| 16 | අධි ශීතකරණ 01යි |
| 17 | වෙස්ටන් වර්ගයේ කුලර් 01යි |
| 18 | අධි ශීතකරණ 01යි |
| 19 | එවරි වර්ගයේ බිම් තරාදි 01යි |
| 20 | බඩ්ඩ්‍රි බිම් තරාදි 01 යි |
| 21 | පිත්තල මල් පෝච්චි 02යි |
| 22 | පිත්තල ඉලත්තට්ටු 01යි |
| 23 | ඔලික් වර්ගයේ බෆල් 02 යි. (ඇම්ප් සහිත) |

ඒ. එස්. දිසාගේ,
නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්,
නියෝජ්‍ය පිස්කල්/ප්‍රොබට් නිලධාරි,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
පොළොන්නරුව.

04-730

---

# විවිධ දැන්වීම්

## (මේජර්) ප්‍රදීප් උඳුගොඩ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

(මේජර්) සුදර්ශන දෙනිපිටිය වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "(මේජර්) ප්‍රදීප් උඳුගොඩ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

*(අ)* දුප්පත් අසරණ ජනතාවට මෙන් ම රෝගීන්ට අවශ්‍ය වෛද්‍ය පහසුකම්, ආහාර ද්‍රව්‍ය සහ නිවාස පහසුකම් සපයා දීම ;

*(ආ)* ආධාර ලැබීමට සුදුසු ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා විශේෂ උපකාර සේවා පැවැත්වීම සහ ශිෂ්‍යත්ව, පුස්තකාල පහසුකම් සහ අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය වෙනත් ආධාර ලබා දීම ;

*(ඇ)* ජ්‍යෝෂ්ඨ පුරවැසි සංවිධාන විසින් ඉටුකරනු ලබන සේවා පහසුකම් සඳහා ආධාර කිරීම හා එම සංවිධාන දිරි ගැන්වීම ;

යනාදිය වේ.

(මේජර්) සුදර්ශන දෙනිපිටිය,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

04-837

**(මේජර්) සුදර්ශන දෙනිපිටිය පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

(මේජර්) ප්‍රදීප් උඳුගොඩ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "(මේජර්) සුදර්ශන දෙනිපිටිය පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථ වලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

*(අ)* දුප්පත් අසරණ ජනතාවට මෙන් ම රෝගීන්ට අවශ්‍ය වෛද්‍ය පහසුකම්, ආහාර ද්‍රව්‍ය සහ නිවාස පහසුකම් සපයා දීම ;

*(ආ)* ආධාර ලැබීමට සුදුසු ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා විශේෂ උපකාර සේවා පැවැත්වීම සහ ශිෂ්‍යත්ව, පුස්තකාල පහසුකම් සහ අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය වෙනත් ආධාර ලබා දීම ;

*(ඇ)* ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධාන විසින් ඉටුකරනු ලබන සේවා පහසුකම් සඳහා ආධාර කිරීම හා එම සංවිධාන දිරි ගැන්වීම ;

යනාදිය වේ.

(මේජර්) ප්‍රදීප් උඳුගොඩ,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

04-838

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.